# නාට්‍ය හා රංගකලාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## 2026/27 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම



යුනෙස්කෝ සංවිධානයට අනුබද්ධ, ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත, ටවර් හෝල් රඟහල පදනම විසින් පවත්වාගෙන යනු ලබන, නාට්‍ය හා රංගකලා (දෙවර්ෂ පූර්ණ කාලීන) උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන වර්ෂ 2026/27 සඳහා නවක සිසුන් බඳවා ගැනේ. මෙම දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව (SLQF 3 හා 4) සාර්ථකව සම්පූර්ණ කර අවශ්‍ය GPA අගය සපුරාලන සිසුන්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා උපාධිය (SLQF 5 හා 6) සඳහා යොමු කරනු ලැබේ.

1. **මූලික සුදුසුකම්**
    - අ.පො.ස.(සා.පෙළ) - සිංහල හා සෞන්දර්යය විෂයන් සඳහා සම්මාන සාමාර්ථයක් හා ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථයක් ඇතුළුව විෂයන් හයකින් සමත් වී තිබීම. (එකී ප්‍රතිඵල එක් සහතිකයකින් ඉදිරිපත් කළ හැකි විය යුතුය.)
    - අ.පො.ස.(උ.පෙළ) - ඕනෑම විෂය ධාරාවකින් සමත් වී තිබීම.
    - වයස - 2026.08.19 දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 25 ට නොවැඩි විය යුතුයි.
2. **බඳවා ගැනීමේ ක්‍රමවේදය**
    - ලිඛිත පරීක්ෂණය - නාට්‍ය හා රංගකලාව ආශ්‍රිත සාමාන්‍ය දැනීම් පරීක්ෂණය සහ සිංහල භාෂා භාවිතය පිළිබඳ දැනුම් පරීක්ෂණය යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකට පෙනී සිටිය යුතුය. (එක් ප්‍රශ්න පත්‍රයකට කාලය පැයකි)
    - ලිඛිත පරීක්ෂණය සමත් වූ අයදුම්කරුවන් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.
    - ඉහත පරීක්ෂණයන්හි ඉහළම ප්‍රතිඵල ලබාගත් 60 දෙනෙකු පමණක් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.
3. **සම්පූර්ණ පාඨමාලා ගාස්තුව**
    - දෙවර්ෂය සඳහාම රු. 200,000.00 කි. එය එක් වරක දී හෝ වාරික හතරකින් හෝ (රු.75,000.00 / රු.45,000.00 / රු.40,000.00 / රු.40,000.00 ලෙස) ගෙවිය හැකිය.
4. **අයදුම්පත් යොමු කිරීම**
    - www.towerhall.lk සබැඳියට පිවිස ගූගල් පෝරමය (Google form) පුරවන්න.
    - අයදුම් පත්‍ර ගාස්තුව වන රු. 2,000.00 ක මුදල ලංකා බැංකුව, හයිඩ්පාක් ශාඛාවේ ටවර් හෝල් රඟහල පදනම නමින් ඇති ගිණුම් අංක 2327541 දරණ ගිණුමට බැර කර, එහි බැංකු පත්‍රිකාව ගූගල් පෝරමයේ අදාළ ස්ථානයෙහි උඩුගත කරන්න. බැංකු පත්‍රිකාව නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
    - ගූගල් පෝරමය සඳහා මෙම සබැඳියට පිවිසෙන්න. https://forms.gle/KcYMgQCaHH6JH8GZ7
5. **ඔබේ අයදුම්පතේ සඳහන් email ලිපිනය සක්‍රීය email ලිපිනයක් විය යුතුය. සියලුම දැනුම්දීම් email හරහා පමණක් සිදු කරනු ලැබේ. ඊට අමතරව සක්‍රීය දූරකථන අංකයක් ද සඳහන් කරන්න.**
6. **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය - 2026.09.18**
7. **වැඩි විස්තර - 0112682133 / 0712424581 ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ අංශ ප්‍රධානී, මනීෂ දුක්ගන්නාරාළ මහතාගෙන් හෝ 0714040040 පාඨමාලා සම්බන්ධීකාරක රවීන්ද්‍ර එදිරිසිංහ මහතාගෙන් විමසිය හැකිය.**



**අධ්‍යක්ෂ ජනරාල්,**
**ටවර් හෝල් රඟහල පදනම**
**සච්සිරිපාය,**
**අංක. 123, විජේරාම මාවත,**
**කොළඹ 07.**